# ආර්ය මහා සංඝ රත්නයට සැදැහැ සිතින් වන්දනාමාන කරන්න ඉරබටු තරුව සේ බබළන දිව්‍ය ආත්මයක් ඔබටත් ලැබේවි

## වන්දන විමානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, විමානවත්ථුපාළි, මඤ්ජෙට්ඨක වර්ගය, පිටු අංක 114 - 117)

මුගලන් මහ තෙරුන් වහන්සේ එක් දෙව් දුවකගෙන් මෙසේ විමසූ සේක.

“පින්වත් දෙව් දුව, ඔබට සුන්දර රූපයක් තිබෙනවා. ඒ වගේ ම ඉරබටු තරුව වගේ හැම දිශාව ම බබළවමින් ඔබ ඉන්නේ. මේ වගේ සිතට ප්‍රිය උපදවන සැප සම්පත් ලැබුණේ මොන වගේ පිනකින් ද?

මහානුභාව ඇති දෙව් දුව, මිනිස් ලෝකෙ ඉන්න කාලෙ මොන වගේ පිනක් ද කළේ?”

සතුටු සිත් ඇති දෙව් දුව මෙසේ පිළිතුරු දුන්නාය.

“ස්වාමීනි, මම පෙර ආත්මයේ මිනිස් දුවක් වෙලයි හිටියේ. මම සිල්වත් ශ්‍රමණයන් වහන්සේලාව දැක්කා. පැහැදුණු සිතින් ඒ ශ්‍රමණයන් වහන්සේලාගේ දෙපා වන්දනා කළා. සතුටු සිත් ඇති ව මම වැඳගෙන හිටියා.

ඒ පිනෙන් තමයි මට මේ ලස්සනත්, මේ සම්පත් සියල්ලමත් ලැබුණේ. සිතට ප්‍රීතිය උපදවන හැම සම්පතක් ම මට පහළ වෙනවා.

මහානුභාව සම්පන්න වූ ස්වාමීන් වහන්ස, මිනිස් ලෝකෙදි ඔය පින තමයි මම කරගත්තේ. මේ දිලිසෙන පුණ්‍ය ඉර්ධිය ඒ නිසාමයි”.